

# ශක්තිමත් මුරපදයක් තෝරාගැනීම හා එය ආරක්ෂා කර ගැනීම

## මුරපදයක් (Password) යනු කුමක්ද ?

මුරපදයක් යනු, සත්‍ය බව සහතික කිරීම (Authentication) සඳහා හෝ තම අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා හෝ සම්පත්/තොරතුරු ප්‍රවේශ (Access) කිරීම සඳහා හෝ භාවිතා වන රහසිගත වචනයකි. පරිශීලකයකු සහ ඔහුගේ පුද්ගලික තොරතුරු අතර ඇති එකම බාධකය මුරපදයයි. වර්තමානයේ මුරපද බිඳීම සඳහා විශේෂයෙන් සකසන ලද වැඩසටහන් තිබුණද, හොඳ මුරපදයක් තෝරා ගැනීමෙන් හා එහි රහස්‍ය බව ආරක්ෂා කිරීමෙන් අනවසර පුද්ගලයෙකු ඔබගේ දත්ත ප්‍රවේශ කිරීමෙන් වළක්වා ගත හැක.

## ඔබට මුරපදයක් අවශ්‍ය වන්නේ කුමක් නිසාද ?

ඔබ එදිනෙදා ජීවිතයේදී භාවිතා කරන විවිධ පුද්ගලික හඳුනාගැනීමේ අංක, මුරපද, මුරවැකි යනාදිය පිළිබඳ මදක් සිතා බලන්න. ATM යන්ත්‍රයෙන් මුදල් ගැනීමේදීත්, හරපත් භාවිතයේදීත්, ඔබගේ පරිගණකය භාවිතයේදීත්, ඉ-තැපැල් ගිණුම් භාවිතයේදීත් (E-mail), සමාජ ජාල වෙබ් අඩවි භවිතයේදීත් (Facebook, LinkedIn) මුරපද භාවිතා කිරීමට සිදුවේ. මෙම මුරපද සියල්ල මතක තබා ගැනීමට සිදුවීම කරදරයක් ලෙස විටක ඔබට සිතෙන්නට හැක. එමෙන්ම, ඔබගේ ඉ-තැපැල් ගිණුම පිළිබඳව හෝ නිරතුරුව හිස් වන බැංකු ගිණුම පිළිබඳව සැලකිලිමත් වන්නේ කවුරුන්ද යැයි ඔබට සිතිය හැක. නමුත් අප සිහිතබාගත යුතු කරුණක් වන්නේ, ප්‍රහාරකයකුට අවශ්‍ය වන්නේ විශේෂයෙන් ඔබගේ ගිණුමට ප්‍රවේශ වීමෙන් නතරවීම නොව, වඩා විශාල හානියක් සිදුකිරීම සඳහා ඔබගේ ගිණුමට අනවසරයෙන් ප්‍රවේශ වීමෙන් ලබා ගන්නා දත්ත භාවිතා කිරීම බවයි. අවසරලත් පුද්ගලයින්ට පමණක් ප්‍රවේශයට ඉඩ දීම, ඔබගේ වැදගත් පුද්ගලික තොරතුරු ආරක්ෂා කර ගැනීමේ හොඳම ක්‍රමයකි. සයිබර් අවකාශයේ මෙලෙස සත්‍ය බව සහතික කිරීම (Authentication) සඳහා ඇති හොඳම විසඳුම මුරපද භාවිතයයි. එම නිසා හොඳ මුරපදයක් භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

## හොඳ මුරපදයක් තෝරාගන්න් කෙසේද ?

බොහෝ පුද්ගලයින් තම මුරපදය ලෙස තෝරා ගන්නේ මතක තබාගැනීමට පහසු, තම පුද්ගලික තොරතුරු ඇසුරින් සකසා ගත් මුරපදයකි. නමුත්, එසේ කිරීම ප්‍රහාරකයකුට ඔබගේ මුරපදය අනුමාන කිරීම පහසු කරවයි. එම නිසා මුරපදයක් තෝරා ගැනීමේදී කිසි විටකත් ඔබගේ නම, ඔබගේ බිරිඳගේ / ස්වාමි පුරුෂයාගේ / දරුවන්ගේ නම්, ඔබගේ උපන් දිනය, ඔබගේ රැකියා ආයතනයේ නම යනාදී පහසුවෙන් අනුමාන කළ හැකි මුරපද තෝරා ගැනීමෙන් වැළකිය යුතුය.

## මුරපද ප්‍රහාර

ශබ්දකෝෂවල ඇති වචන ඇසුරින් මුරපද බිඳීම සඳහා විශේෂයෙන් සකසන ලද වැඩසටහන් හා මෘදුකාංග ඇති බැවින්, ශබ්දකෝෂවල ඇති වචන මුරපද ලෙස භාවිතා නොකළ යුතුය. මෙසේ ශබ්දකෝෂවල ඇති සියලු වචන අත්හදා බැලීමෙන් මුරපද බිඳීම “ශබ්දකෝෂ ප්‍රහාරයක්”(Dictionary attack) ලෙස හැඳින්වේ. සිතාමතාම වැරදි ලෙස අක්ෂර වින්‍යාස සහිත වචන මුරපද ලෙස භාවිතා කිරීම මෙවැනි ප්‍රහාරයන්ගෙන් ගැලවිය හැකි මගකි.

ප්‍රහාරකයා විසින් පරිශීලකයාව නොයෙකුත් සමාජ  ප්‍රයෝග හා උපක්‍රම භාවිතා කරමින් ඔහුගේ/ ඇයගේ පෞද්ගලික, රහසා හා වෙනත් වැදගත් තොරතුරු ලබා ගැනීමට තැත් කිරීම හා ලබා ගැනීම "සමාජ ඉන්ජිනේරු ප්‍රහාරයක්" (Social engineering attack) ලෙස හඳුන්වයි. ආරක්ෂාකාරී ලෙස අන්තර්ජාලය භාවිත කිරීම මේ සඳහා ඇති විසඳුමයි.

## පියවර කිහිපයකින් හොඳ මුරපදයක් සාදා ගනිමු...

- මුරපදයක් තනා ගැනීමේ හොඳ ක්‍රමයක් වන්නේ යම්කිසි වචනයක් හෝ වචන සංකලනයක් ගෙන, එය මතක තබා ගැනීම සඳහා යම්කිසි මතක උපක්‍රමයක් භාවිතා කිරීමයි. නිදසුනක් ලෙස,"[W]adiya [k]adana [n]araka [l]amai [h]ema [n]owe [a]pi" (වැඩිය කඩන නරක ළමයි හෙම නොවේ අපි) වෙනුවට, "**WkN1hn@**" වැනි වදනක් මුරපදය ලෙස භාවිතා කිරීම.
- මුරපදය තැනීමට යොදාගන්නා හෝඩියේ මහකුරු (Capital letters) සහ කුඩකුරු (Simple letters) වල සංකලනයක් මුරපදය ලෙස භාවිතා කිරීම.
- මුරපදය තැනීමට යොදාගන්නා හෝඩියේ අක්ෂර, ඉලක්කම්, විශේෂ අක්ෂර, සංකේත යනාදියේ එකතුවක් මුරපදය ලෙස භාවිතා කිරීම. (a-z), (,.”?),(!@$%^&*),(0-9)
- මුරපදය හැකි තරම් අර්ථ විරහිත ලෙස සාදා ගැනීම.
- මුරපදයේ දිග වැඩිවත්ම එය බිඳීමේ අපහසුවද වැඩි වේ. එබැවින් දිගින් වැඩි මුරපදයක් භාවිතා කිරීම. (අවම‍ය 7 හෝ වැඩි)
- විවිධ පද්ධති හා ගිණුම් සඳහා එකම මුරපදයක් භාවිතා කිරීමෙන් වැළකීම.
- මුරපදයට අමතර ස්තර ආරක්ෂාව (Extra layer of security) ලබා දිය හැකි අවස්ථාවන්හිදී එය සක්‍රිය කිරීම. (ද්විත්ව සාධක සත්‍යාපනය - Two factor verification) - Gmail හා Facebook වැනි වෙබ් අඩවි වල මෙම ක්‍රමය භාවිත කල හැක.

## ඔබේ මුරපදය ආරක්ෂා කර ගන්නේ කෙසේද ?

හොඳ මුරපදයක් තෝරා ගැනීමෙන් පසු, එය ආරක්ෂා කර ගැනීමද ඔබගේ වගකීමකි. මුරපදය අනෙකුත් පුද්ගලයින්ගේ ඇස නොගැටෙන අයුරින් තබා ගත යුතුය. මුරපදය ලියා තැබූ කොළ කැබලි පරිගණකය අසල දමා යාම මගින් ඔබගේ රැකියා ආයතනය තුළට පැමිණිය හැකි පුද්ගලයකුට ඔබේ මුරපදය පහසුවෙන්ම සොරකම් කළ හැකි වනු ඇත. වෙනත් කිසිවෙකුට ඔබගේ මුරපදය පැවසීමෙන් වළකින්න. එමෙන්ම, දුරකථන ඇමතුම් මගින් හෝ ඉ-තැපැල් පණිවුඩ මගින් වංචාකාරී ලෙස ඔබෙන්ම මුරපදය දැන ගන්නා ප්‍රහාරකයන් පිළිබඳ සැලකිලිමත් වන්න.

ඔබගේ අන්තර්ජාල පහසුකම් සපයන්නා ඔබට සත්‍යාපන පද්ධති තෝරා ගැනීමේ පහසුකම සපයන්නේ නම්, සරල මුරපද භාවිතා කරන පද්ධතියක් වෙනුවට, මුරපද සඳහා Kerberos, Public key encryption වැනි ගුප්ත කේතන ප්‍රොටෝකෝලයක් (Encryption protocol) භාවිතා කරන පද්ධතියක් තෝරා ගන්න.

බොහොමයක් පරිගණක වැඩසටහන්වලින් මුරපදය මතක තබා ගැනීමේ පහසුකම සපයනු ලැබේ. නමුත් මෙවැනි වැඩසටහන් මගින් එසේ ගබඩා කරගන්නා තොරතුරු වලට ලබා දෙන ආරක්ෂාවද විවිධය.

නිදසුනක් ලෙස, සමහර ඉ-තැපැල් සේවාලාභීන් මුරපද යනාදී වැදගත් තොරතුරු සරල වදන් ලෙස පරිශීලකයාගේ පරිගණකයේම ගබඩා කිරීම සිදු කරයි. එවිට ඔබගේ පරිගණකයට ප්‍රවේශ විය හැකි කවරෙකුට වුවද, ඔබගේ මුරපද යනාදී වැදගත් තොරතුරු පහසුවෙන්ම සොයා ගත හැකිවනු ඇත.

එම නිසා ඔබ පුස්තකාලයකදී, Internet cafe වැනි ස්ථානයක ඇති පොදු පරිගණකයක් භාවිතා කරන විටදී මෙන්ම, ඔබගේ රැකියා ආයතනයේ ඇති හවුල් පරිගණකයක් භාවිතා කිරීමේදීද, ඉ-තැපැල් ගිණුම සහ අනෙකුත් අන්තර්ජාල ගිණුම් තුලින් නිවැරදිව ඉවත් වීමට වගබලා ගත යුතුය.

ආරක්ෂාකාරී අන්තර්ජාල භාවිතය සඳහා ඔබගේ නිවසේ යතුරු මෙන් ඔබගේ මුරපද ආරක්ෂා කරගන්න.

ඔබගේ ගැටලු පහත ක්‍රමයන් මගින් අපට දන්වන්න.

https://techcert.lk/en/report-form
දුරකථන - +94 11 4 462 562
ඉ-තැපැල් - help@techcert.lk

මෙම ලිපිය ලක් වසම් අධිකාරිය සහ අන්තර්ජාල සමාජයේ ශ්‍රී ලාංකීය ශාඛාව එක්ව සකසන ලද්දකි. වැඩි විස්තර සඳහා පිවිසෙන්න. http://nic.lk/index.php/training-materials.


Sri Lanka Chapter
HELPING YOU SECURE YOUR INFORMATION ASSETS